Ю. Чарушин 1.04

Тони говорит!

ප්‍රගති ප්‍රකාශක මන්දිරය. මොස්කව්.

කැලෑ පුස් පැටියා

ЕВГЕНИЙ ЧАРУШИН

ЗВЕРЯТА

На сингальском языке

අශෝකා කුමාරි සතරසිංහ

ගේ. චරුමිත්

1·04

වන පොවිලෙදු

චිත්‍ර: ගේ. චරුමිත්

පද්මලාල් නලින සතරසිංහ

ප්‍රගති ප්‍රකාශකයෝ මොස්කව්

කැලෑ පූස් පැටියා

එකෝමත් එක කැලෑවක පාළු පිටියක් හරහා පුංචි දිය පාරක් ගලායනවා. එය වටේට තණ පඳුරු බොහොම තියෙනව. ඒවයේ පාට එකිනෙකට වෙනස්.මීමැස්සො මල්වලින් රොන් උරා ගන්නව. බඹරු නාද කරනව. මදුරුවො පුංචි දේවදූර ගස් ළඟ එකට ගුළිවෙලා උඩ පැන පැන පියාඹනවා.

පාළු පිටිය බොහොම පුංචියි. හරියට කාමරයක් වගෙ. පළල අඩි පහක් විතර ඇති. දිග අඩි දහයක් විතර ඇති. එය වටේට නොයෙක් ජාතිවලට අයත් පලු වර්ග වැවිලා. කැලෑව පුරාම නත්තල් ගස්.

මම තුවක්කුවත් අරගෙන කැලේටගියා දඩයම් කරන්ට. එතකොට මට පෙනුණා බොහොම හොඳට වැඩුණු පඳුරු. මම ඔය පඳුරකට මුවා වෙලා පාළු පිටිය දිහා බැලුවා!

''මෙහෙ නැතිද කැලෑ සත්තු?'' කියල මම හිතුවා.

මෙන්න එතකොටම කැලෑ සතෙක් එනව.

හොඳටම පුංචි, චූටි පූස් පැටියෙක් එනව, උගෙ ඔළුව ඇඟට වඩා ලොකුයි. වලිගය කොටයි. වලිගයක් නොවෙයි වලිග පොඩිත්තක්. උගෙ ඇස් දෙක ලොකුයි. පෙණුම අහිංසකයි. උස ලේනෙක් තරම ඇති.

පූස් පැටියා සෙල්ලම් කරනව. දිග පිදුරු ගහක් කටින් අරගෙන, උඩුබැලි අතට පෙරළිලා, පස්සා ගාත්වලින් පිදුරු ගහ උඩ දම දමා සෙල්ලම් කරනව. පස්සා ගාත් ඉස්සරහ ගාත් වලට වැඩිය දිගයි. යටි පතුල්වල හම ගොරෝසුයි. හමට යටින් පුංචි මෙටට තියෙන්නා වගෙ.

පිදුරු ගහ එක්ක සෙල්ලම් කිරීම චූටි පූසට එපාවුණා. උඟ මැස්සෙකු පස්සෙ එළවන්ට පටන් ගත්තා. ඊට පස්සෙ මලකට පයින් ගැහුවා. මලක් කඩාගෙන කටේ දමාගෙන හැපුවා. මල තිත්ත නිසාදෝ ඔළුව වනලා කෙළ ගැසුවා.

කෙළ ගැහුවා, පුරු-පුරු ගාලා ශබ්ද කළා. ඉඳගෙන හති හැරියා. එතකොට, එකට ගුළිවෙලා උඩ පැන පැන ඉන්න මදුරුවන්ව දැක්කා.

උන් ළඟට කිට්ටු වෙලා ඉස්සරහ ගාත් දෙක පළල් කරලා උඩ පැන්නා. මදුරු ගුළිය එකපාරටම අල්ලාගන්න හිතාගෙනයි එහෙම කළේ. ඒ වුණාට එක මදුරුවෙකුවත් අල්ලාගන්ට ඌට බැරිවුණා. එතකොට ඌ බඹරෙකු දැක්කා. පූස් පැටිය හොරෙන් හොරෙන් බඹරා ළඟට කිට්ටුවුණා. බඹරා වහලා හිටිය මලට පූස් පැටිය පස්සා ගාතෙන් පාරක් ගැහුවා විතරයි, ඌ බිම වැටුණා! බඹරා පූස් පැටියාට ඇන්නා! එතකොට ඌ ඈවි කියල ඇඩුවා.

බඹර විස උරල පූස් පැටියට උදව් කරන්න මට හිතුණා. ඒ වුණත් එය නුවණට හුරු නැති බව මට පෙනුණා. මම පුළුවන් තරම් වැර යොද දුවන්ට පටන් ගත්තා. අතු අග ඇස්වලට වැදෙන්නෙ නැතිවෙන්ට ඇස් පියා ගන්ට විතරයි මට වෙලාවක් තිබුණෙ. මග හරහා වලවල්. මම ඒවට උඩින් පනිනවා. මග හරහා පඳුරු තිබුණොත් ඒවටත් උඩින් පනිනවා. අන්තිමට ගං ඉවුරට දුවගෙන ගිය හැටියෙම තණ බිස්සක් උඩ දඩාස් ගාලා මා ඇද වැටුණා. ''පූස් පැටියා ළඟට නොගිහිං ඉක්මනට දුවගෙන ආ එක හොඳයි'' කියල මට හිතුණා.

ඌ එසේ මෙසේ පූස් පැටියෙක් නොවෙයි. කලවැද්දෙක්. පැටියා නිවීහැනේ පිටියට වෙලා සෙල්ලම් කරනතුරු අම්මා දඩයමේ යන්ට ඇති. පැටියා සද්ද කළොත් අම්මා පැටියට උදව් කරන්න එනව සහතිකයි. මහ කලවැද්දට අහුවුණා නම් මාව කෑලිවලට ඉරා දමාවි. අවාසනාවකට වගෙ, මගෙ තුවක්කුවෙ තියන වෙඩි උණ්ඩවලින් කුරුල්ලන්ට මිස ඒ වගෙ සතෙකුට වෙඩි තියන්ට බැහැ.



වෘක පැටියා

කැලෑවක වෘක පැටියෙකුයි, වෘක අම්මා කෙනෙකුයි හිටියා.

ඔන්න දවසක්ද වෘක-අම්මා දඩයමේ ගියා.

මිනිහෙක් වෘක පැටියාව අල්ලා ගෙන, මල්ලක දමාගෙන නගරෙට ගෙනාවා. ඔහු කාමරයක් මැද මල්ල තැබුවා.

බොහෝ වේලා යනතුරු මල්ල නොවෙයි හෙලවුණේ. එකපාරට මල්ල ලිහිලා වෘක පැටියා එළියට ආවා. ඌ එක පැත්තක් බැලුවා විතරයි බය වුණා: මිනිහා වාඩිවෙලා ඌ දිහා බලාගෙන ඉන්නව.

ඌ අනිත් පැත්ත බැලුවා: කළු පූසෙක් මුරු-මුරු ගානවා, මයිල් පුම්බාගෙන තරහෙන් පිපිරි පිපිරි ඉන්නවා. පූසා ළඟ හිටගෙන ඉන්න බලු කුක්කෙක් දත් විරිත්තනවා.

වෘක පැටියා පණ බයේ ගැහෙන්ට වුණා. ඌ ආයෙමත් මල්ලට රිංගන්ට හැදුවා. ඒ වුණාට හිස් මල්ල ගෝනි පඩංගුවක් වගෙ බිම වැටිල තියෙනව. මල්ල ඇතුළට ආපහු රිංගන්ට ඌට බැහැ.

කළු පූසා මයිල් පුම්බාගෙන තරහයෙන් පිපිරි පිපිරි හිටියා. ඌ මේසෙ උඩට පැනලා පිරිසිය බිමට පෙරළුවා. එතකොට එය බිඳුණා.

බලු කුක්කා බිරුවා.

''හා! හා! හා! හා!'' කියල මිනිහ හිනා වුණා.

පුටුව යටට රිංගා ගත්තු වෘක පැටියා පණ බයේ ගැහෙන්ට පටන් ගත්තා.

පුටුව තියෙන්නෙ කාමරේ මැද.

පුටු ඇන්දට නැගලා පූසා එබිකම් කර කර බලනවා.

බලු කුක්කා පුටුව වටේට දුවනවා.

මිනිහා වාඩිවෙලා දුම් බොනවා.

පුටුව යට ඉන්න වෘක පැටිය පණ බයේ ගැහෙනවා.

රෑ වුණා. මිනිහා නිදගත්තා. බලු කුක්කාටත් නින්ද ගියා. පූසා නිදි කිරා වැටෙනවා.

පූසො නිදගන්නෙ නෑ. නිදි කිරනවා විතරයි.

පුටුව යටින් එළියට ඇවිත් වෘක පැටියා වටපිට බලනවා.

ඒ අතටයි මේ අතටයි ගමන් කරල ඉව ඇල්ලුවා. ඊට පස්සේ හූ හඬ තිබ්බා.

බලු කුක්කා බිරුවා.

පූසා මේසය උඩට පැන්නා.

මිනිහා ඇඳ උඩ ඉඳගෙන අතක් වනලා සැර වුණා. වෘක පැටියා ආයෙමත් පුටුව යටට රිංගාගත්තා. හෙල්ලෙන්නේ නැතුව ඌ එතනම හිටියා.

උදේ පාන්දර, මිනිහා පිරිසියට කිරි වත් කරලා යන්ට ගියා. පූසයි බල්ලයි එකතුවෙලා කිරි බොන්ට පටන් ගත්තා.

පුටුව යටින් එළියට ආ වෘක පැටියා දෙර ළඟට බඩගෑවා. දෙර ඇරලා තිබුණා!

දෙරෙන් පඩිපෙළටත්, පඩිපෙළ දිගේ පාරටත්, පාරෙන් ඒදණ්ඩටත්, ඒදණ්ඩෙන් එළවුළු කොටුවටත්, එළවුළු කොටුවෙන් වෙලටත් ඌ පැනලා ගියා.

වෙලෙන් එහා කැලෑව.

කැලෑවෙ වෘක — අම්මා.

වටේටම ඉව අල්ලලා සන්තෝසවෙලා කැලෑව දිගේ ඌ දිව්වා.

ඔන්න ඔහොමයි වෘක පැටියා වෘකයෙක් වුණේ.



යාළුවෝ

කැලෑ කෝරාළ කෙනෙක් දවසක් ද කැලෑව හරහා පාරක් කපනකොට හිවල් ගුහාවක් දක්කා. එකම එක හිවල් පැටියෙක් විතරයි, ඒ ගුහාව ඇතුළෙ හිටියෙ. හිවල්-අම්මා අනිත් පැටවුන්ව වෙනින් තැනකට ගෙනියලා වෙන්ට ඇති.

කැලෑ කෝරාළගේ ගෙදර හිටියා දඩයම් වරිගෙට අයත් බලු පැටියෙක්. ඌත් වූටියි. හිවල් පැටියයි, බලු පැටියයි එකට හැදුණා, එකට වැඩුණා. උන් ලගින්නෙත් එකට, සෙල්ලම් කරන්නෙත් එකට.

බොහොම අගේට උන් සෙල්ලම් කළා! හිවල් පැටියා හරියට පූසෙකු වගෙ බඩගෑවා, උඩ පැන්නා. පුටුව උඩට පැනලා පසුව මේසෙ උඩට පනිනවා. බටයක් වගෙ වල්ගෙ උස්සාගෙන බිම බලනවා. බලු පැටියා පුටුව උඩට පනිනවා, නමුත් පැන ගන්ට බැහැ. බිම වැටෙනවා. ඉතින් මේසය වටේ දුවමින් බුරනවා, පැයක් තිස්සේම ඔහොම බුරනවා. බලු පැටියට හති වැටුණට පස්සෙ හිවල් පැටියා බිමට පනිනවා. ඊට පස්සේ දෙන්නම නිදගන්නවා.

ඔහොම නිදගෙන ඉඳලා, හතිඇරලා, ආපහු එකා පස්සේ එකා එලවන්ට පටන් ගන්නවා.

බලු පැටියා ගින්දර වගෙ රතු පාට හින්ද ඌට රත්තා කියල නම් තැබුව. හිවල් පැටිය පූසෙක් වගෙ හීන් හඬින් ඝෂාව් ගාන හින්ද ඌට පුසියා කියල නම් තැබුවා.

සරත් කාලෙ පැටව් දෙන්නම එකට වැඩුණා. හේමන්ත කාලෙ වෙනකොට උන් ලොකුවුණා. හිවලාට කැලෑවට යාමට ඉඩ තියන්නේ නැතිව ඌව දම්වැලකින් බැඳලා දැම්මා. කැලෑ කෝරාළ දඩයම්කාර රත්තා එක්ක කැලෑවට ගිහින් හාවුන් දඩයම් කරනවා.

දවසක් ද උදේ පාන්දර කැලෑ කෝරාළ හිවලාට කෑම දෙන්ට ආවා. හිවල් කූඩුව දිහා බැලින්නම් හිවලා නෑ. දම්වැල විතරයි කූඩුවෙ ඉතුරු වෙලා තිබුණේ.

''උඹට හීලෑ සතෙක් වෙන්ට බැහැ. කැලෑවෙදී මුණගැහුණොත් වෙඩි තියනව'' කියල කැලෑ කෝරාළ හිතාගත්තා.
රත්තාට අඩගහල තුවක්කුව අරගත්තා.

''හොයපන්, රත්තො උඹේ යාළුවාව හොයපන්'' කියල කැලෑ කෝරාළ බල්ලාට හිවලගෙ අඩි පාරවල් පෙන්නුවා. උගේ අඩිපාර හිමගොඩේ තිබුණා.

රත්තා ඉවඅල්ලමින් බුර බුරා යන්ට පටන් ගත්තා. බුරනවා, ඉව අල්ලනවා, අඩිපාර දිගේ දුවනවා. ඔහොම කැලෑවෙ මැදට ගියා. බල්ලා බුරන හඬ පවා ඇහෙන්නේ හෙමින්. එකපාරටම බල්ලා නැවතුණා. ඔන්න ඌ ආපහු හැරිලා එනවා. බුරන හඬ ළඟ ළඟම ඇහෙනවා. කැලෑ කෝරාළ කඳු බෑවුමක නත්තල් ගහකට මුවා වෙලා කොකා අමුනලා තුවක්කුව සූදානම් කරගත්තා වෙඩි තියන්ට.

කැලෑවෙ ඉඳල බල්ලයි හිවලයි දුවගෙන ආවා. උන් දෙන්නා ඉතාම හොඳ යාළුවො වගෙ කරෙන් කර ගැටී එනව! ඉතින් කොහොමද වෙඩි තියන්නෙ? බල්ලාට වෙඩිපහර වැදුණොත් ඌ මැරිලයාවි.

උන් දෙන්නා කැලෑ කෝරාළව දැකල දුවගෙන ආවා. පුසියා හාම් පුතාගෙ උරහිසට පැන්නා. රත්තා ඉස්සරහ ගාත් කෝරාළගෙ ඇඟට තියලා පස්සා ගාත්වලින් හිට ගත්තා. ඊට පස්සෙ ඌ හිවලගෙ වල්ගෙ හපමින් හුරතල් කළා.

''අනේ, අනේ උඹල හරි සත්තු'' කියල කැලෑ කෝරාළ කීවා. ඔහු තුවක්කුවෙ කොකා ගළවලා දමලා ගෙදර ගියා.

හීත කාලෙ ඉවරවෙන තුරු හිවලා ගෙදර හිටියා. ඌව දම්වැලෙන් බැඳලා තැබුවේ නෑ. ඌ නිදහසෙ හිටියා. වසන්ත කාලෙදි මීයන් දඩයම් කරන්ට කැලේට යන්ට පටන් ගත්තා. ඔහොම දඩයම් කරනකොට දවසක් ද හිවලා ගෙදර නැවිත් කැලේ නැවතුණා.

එද හිට දඩයම්කාර රත්තා හිවල්ලු පස්සෙ පන්නන්නේ නෑ. ඔක්කොම හිවල්ලු උගෙ යාළුවො හින්ද වෙන්ට ඇති.

මුව පැටව්

දවසක්ද මුව පැටව් දෙදෙනෙකු සත්ව උද්යානයට ගෙනාවා. උන්ගෙ උස එළු පැටියෙකුගෙ තරම ඇති.

පිරිමි පැටියගේ අං දෙබලට බෙදී වැඩිල තියෙනව. ගෑණු පැටියට අං ඇත්තෙම නෑ.

මුව පැටව් දෙන්නගෙ ඇස් ලොකුයි, කළුපාටයි, ඇස් පිහාටු මිනිසුන්ගෙ වගෙ.

මුව පැටව් මිනිසුන්ට පොඩ්ඩක්වත් බය නෑ. මිනිසුන්ගෙ අත්වල නහය අතුල්ලලා කෑම ඉල්ලන්ට උන් පුරුදුවුණා. මිනිසසු උන්ගෙ කන් කසනකොට උන්ට හරිම සන්තෝසයි.

එක දවසක් උන්ගෙ කුඩුව කැන්වස් රෙදිවලින් අහුරලා තියෙනව මම දැක්කා. කැන්වස් රෙදි ගළවන්ට බැරි වෙන ලෙස ඇන ගහල තිබුණා.

''මුව කුඩුව මොකටද කැන්වස් රෙදිවලින් වහල තියෙන්නෙ?'' කියල මම ඇහුවා.

''මුව දෙනට පුංචි මුව පැටව් ලැබුණ හින්ද!'' කියල කිව්ව.

මට මුව පැටව් නොබලා ඉවසාගෙන ඉන්ට බැරිවුණා. කොහොම හරි කැන්වස් රෙද්දට යටින් බැලුවා. චූටි මුව පැටව් දෙන්නෙක්. උන්ගෙ ඇඟපුරා කහ පාට, සුදු පාට ලප. උන්ගෙ උස පූසෙක් තරම ඇති. ඇස් ඇරගෙන කන් උස්සාගෙන උන් මා දිහා බලන්ට පටන් ගත්තා.

උන්ගෙ කකුල් සුදුපාටයි. ඉස්සරහ ගාත්වල දණහිස් එකට වදිනවා. කුර දෙපැත්තට විසිරිල ගිහිල්ල.

උන් මා දිහා බොහෝ වේලා බලාගෙන හිටියා. පස්සෙ බයවෙලා වගෙ අහකට යන්ට ගියා. උන්ට මාව එපා වෙන්ට ඇති.

හා පැටව්

දවසක්ද කොල්ලෝ කීප දෙනෙක් තණ පිටියක හිටිය හා පැටවුන් තුන්දෙනෙකු ගෙනාවා. උන්ව අල්ලා ගත්තේ තණකොළ කැපුවට පස්සෙ.

හා පැටව් හරිම ලස්සනයි! පුළුන් බෝල වගෙ! කන් දිගයි, ඇස් ලොකුයි, දුඹුරු පාටයි. හරියට ලොම්වලින් හදපු සපත්තු ඇඳගෙන හා පැටව් ඇවිදිනවා වගෙ.

අපට හිතුණා උන්ට කෑම දෙන්න. තණකොළ දුන්නා — කන්නේ නෑ. පිරිසියට කිරි වත්කළා — කිරි බොන්නේ නෑ...

බිම තැබුවා. කාටවත් පය බිම ගහලා ඉන්ට ඉඩක් දෙන්නේ නෑ. හා පැටව් අපේ කකුල්වල හැපෙනවා. සපත්තුවල නහය අතුල්ලනවා, ලෙවකනවා... හා-අම්මාව සොයනවා වෙන්ට ඇති.

උන්ට බඩගිනි වුණාට තවම කෑම කන්ට දන්නේ නෑ. කිරි උරන වයස.

ඉතින් අපි කොහොමද හා පැටවුන්ට කෑම දෙන්නෙ? අනේ පව්! උන් බඩගින්නේ මැරිල යාවි. හා පැටවුන්ට කිරි අම්මා කෙනෙකු හොයන්ට ඕන.

දවසක් ද දඩයමේ ගිහින් එනකොට කැලෑ කෝරාළගේ ගෙදර පූසියෙක් හා පැටියෙකුට කිරි දුන් හැටි මට මතක් වුණා. මා පුදුම වෙලා බලාගෙන ඉන්නකොට කැලෑ කෝරාළ මගෙ දිහා බලා හිනා වෙන්ට පටන්ගත්තා:

''එයත් වැඩක්ද. සත්තු වත්තෙ බැල්ලියක් සිංහ පැටියෙකුට කිරි දෙන හැටි මම දැක්කා...''

ඉතින් අපි ගියා පූසි-අම්මෙකු හොයන්ට.

පූසි-අම්මා බංකුවක් උඩ වැතිරිලා පූස් පැටවුන්ට කිරි දෙමින් හිටියා. පූසි-අම්මාගෙ ඇඟ පුරා වයිරන්. නහයත් වයිරන් වැටිලා වගේ.

පූසි-අම්මාව උස්සාගෙන ආවා. පූසි-අම්මා හා පැටවුන් දිහා බලා පුම්බනවා. පුරු-පුරු ගානවා! ගොර වන්නේ නැති ටික විතරයි! ඌට යන්ට ඉඩ හැරියා.

වෙනින් කිරි අම්මා කෙනෙකු හොයන්න ගියා. ගමේ කෙළවර දී පූසකු දැක්කා. එයා හරිම හුරතල්. ඒ වුණාට ඒ හුරතලී හා පැටවුන්ව ඉනාකෑවා විතරයි. හා පැටවුන්ව දැක්ක හැටිය මීයන්ව අල්ලාගෙන කන්නා වගෙ කන්ට පැන්නා. බොහොම අමාරුවෙන් පූසාව ගෙදරින් එළියට විසිකරල දැම්මා.

වාසනාවකට වගෙ තුන්වැනි වාරයටත් පූසි-අම්මා කෙනෙකු හොයාගන්ට බැරි වුණා නම්, අපේ හා පැටව් බඩගින්නේ මැරිලා යනවා ඇති. ඒ පූසා උගේ පැටවුන් හොයමින් ආවා. රතු පාටයි ඒ පූසි-අම්මා. අපි එයාට කන්ට දුන්නා, බොන්ට දුන්නා. පූසි-අම්මා ළඟට හා පැටවුන්ව කිට්ටු කළා. එක පාරටම උන් කිරි උරන්ට පටන් ගත්තා, තලු මරන්ට පටන් ගත්තා! මුලදී පූසා වැඩිය කැමති වුණේ නැහැ. පස්සේ ඌ දරු නැලවිල්ලක් ගයන්නා වගෙ මුරු-මුරු ගෑවා.

දවස් බොහෝ ගණනක්ම පූසි අම්මා හා පැටවුන්ට කිරි දුන්නා. ජනේලෙ ළඟ වැතිරිලා සින්දු කියන්නා වගෙ මුරු-මුරු ගානවා. එයා හරි සන්තෝෂෙන් අව්ව තපිනවා. එයා ළඟ හා පැටව් වැතිරිල ඉන්නවා.

ඔහොම කල් යනකොට හා පැටව් වැඩී ලොකුවෙලා තණකොළ කන්ට පටන් අරගෙන කැලේට ගියා.

පූසි-අම්මාට පූස් පැටව් ලැබුණා.

වලස් පැටව්

දඩයම්කාරයෝ කැලෑ තුනක හිටි වැලහින්නියන් තුන්දෙනෙකුව මරා දමලා උන්ගේ පැටවුන්ව සත්ව උද්යානයට ගෙනාවා.

පැටව් තුන්දෙනාව සත්ව උද්යානයේ එකම කූඩුවක් තුළට දාලා ඇතිකරන්ට පටන් ගත්තා. එකෙක් දම් පාටයි, අනිකා රතු පාටයි, තුන්වැන්නා කළු පාටයි.

පුංචිම වලස් පැටියා කනගාටුවෙන් වගෙ ඉන්නවා. මුල්ලක ඉඳගෙන බඩ කසනවා, කකුලක් කටේ දාගෙන උරනවා, හැම තිස්සේම ගොර ගොර ගානවා.

අනිත් දෙදෙනා පොර බදනවා, කූඩුව දිගේ නගිනවා, දඟ කරනවා, හති හරිනවා. උන්ගෙ ඇඟ පුරාම මයිල්. බඩ ඉස්සරහට නෙරා ගිහිං. කකුල් බකලයි.

එක පැටියෙක් අනිත් දෙදෙනාට වැඩිය උස ගියාට කන්නවත් දන්නේ නැහැ. එයාට සත්තුවත්තේ සේවිකාව බෝතලයකින් කිරිදෙනවා.

කිරි බෝතලයක් අරගෙන බෝතල කටට පෙනේර රෙදි කෑල්ලක් ඔබලා, පැටියට දෙනවා.

වලස් පැටියා බෝතලේ අල්ලාගෙන පෙනේර රෙදි කෑල්ල උරනවා. කූඩුව ඇතුළට කාටවත් එන්ට දෙන්නේ නැහැ, ගොරවනවා, ඔය විධියට බය කරනවා!

කළු පාට වලස් පැටියගේ පපුවෙ සුදු පාට ලපයකි. එයාගේ වැඩේ කූඩුවේ යකඩ කනු දිගේ බඩගෑමයි. වහලට යන තෙක් බඩගානවා.

ඔහොම බඩගාගෙන ගිහිල්ලා, ගිහිල්ලා වහලෙ බාගයක් වනතුරු නගිනවා. එතැනින් එහාට කොහොමටවත් හෙල්ලෙන්නේ නැහැ.

හතර ගාතෙන් යනවා, තරහෙන් ගොරවනවා, උඩට නැගගන්ට බැහැ. ආපසු පහත බහිනවා.

හොඳ උපායක් ඌට කල්පනා වුණා. යකඩ පොල්ල දත්වලින් අල්ලාගෙන එල්ලිලා ඉඳගෙන කකුල්වලට විවේක දෙනවා. එල්ලී ඉඳගෙන හති ඇරලා වහළටම නැග්ගා. වහල දිගේ යන්ට ගිහිං පය ලිස්සා බිම වැටුණා. වේදනාවෙන් කෑගැසුවා.

සේවිකාව ඇවිල්ලා වලස් පැටියාව උස්සා කර පින්නාගෙන නලවනවා, අත ගානවා.

වලස් පැටියා නිහඬ වුණා. සේවිකාවගෙ සාක්කුවෙ සීනි බෝලයක් තියෙන බව ඌ ඉව අල්ලා දැනගත්තා. කඩදාසියත් පිටින් කටේ දමාගෙන 'චව්' 'චව්' ගාලා තලුමරන්ට පටන් ගත්තා.

වලස් පැටවුන්ට කිරි බත් ගෙනාවා.

තුන් දෙනාම කිරි බත් පෙට්ටියට ළංවෙලා, තලු මර, මර කන්ටයි, හති දමමින් පිඹින්ටයි පටන් ගත්තා.

හිටි හැටියේ එක පැටියෙක් බෙරිහන් දුන්නා. වහළ ගළවා යන තරම් හයියෙන් කෑගහනවා.

තවම හරියට කන්ටවත් දන්නේ නැති වලස් පැටියා දවසක් ද කූඩුවට කිරි ගෙනා විට, එයින් එළියට පැනලා ගියා. කූඩුව ළඟ තිබුණු ඉදලක් දකලා, ඔන්න ඒක දිගේ බඩගාන්ට පටන් ගත්තා.

ඊට පස්සේ ඉදලත් එක්ක බිම ඇදගෙන වැටුණා. පොළොවෙ හැපිලා ඇඟ සීරුනා. ඉදල්මිට පැටියගේ ඔලුවෙ හැප්පුනා.

බිම දිගාවෙලා ඇස් වහගෙන කෙඳිරි ගානවා. ඒ වුණාට ඉදල අත හරින්නේ නෑ. ඌට රබර් සූප්පුවක් දුන්නාම ඌ ඒක උරන්ට පටන් ගත්තා.

වලස් පැටව් කිරිබත් කෑවා. උන්ගෙ පාට අඳුනා ගැනීමට බැරිවන තරමට ඌ ඇඟ පත පුරා කිරිබත් ගා ගත්තු හන්ද ඇඟ පුරා සුදු පාට තීරු සහ ලප ඇතිවුණා.වලස් පැටව් බඩපුරා කිරිබත් කාලා ආයිමත් පටන් ගත්තා සෙල්ලම් කරන්ට.